# 7. අස්සීරා වන්නාරීහ්

## 7.1 නබි (සල්) තුමාණන්ගේ මක්කා ජීවිතය

විශ්වයටම දායාදයක් වන සේ අවසාන නබිවරයාණන් ලෙස අල්ලාහ් විසින් ලොවට පහළ කරුණු ලැබූ නබි (සල්) තුමාණන් ස්වකීය ජීවිත කාලයේ වැඩි කොටසක් මක්කාවෙහි ගත කරන්නට යෙදුනහ. වසර පනස් තුනක් පමණ වූ නබිවරයාණන්ගේ එම කාලයෙහි ඉතා සුවිශේෂි වූ සිදුවීම් කිහිපයක් දක්නට ලැබිණි. එම සිදුවීම් එතුමාණන්ගේ ජීවිත කාලයෙහි වැදගත් සංධිස්ථානයන් වශයෙන් ද හැඳින්විය හැකිය.

### ප්‍රථම වහිය (දිව්‍ය වැකිය)

සමාජ හැදියාවන් පරිහානියට ලක්ව අරාජිකත්වය රජවුත්, පිළිම වන්දනාවට උසස්ම ස්ථානයක් හිමිව තිබුණා වුත් කාල වකවානුවක, ස්වාභාවික සම්පත්වලින් අඩු ලුහුඬුකම් පැවැති මක්කා නගරයෙහි රසූල් (සල්) තුමාණන් ක්‍රි. ව. හයවන ශත වර්ෂයේ උපත ලැබුවෝය. ළමා අවධියේ සිටම මෙබඳු පසුබිමක වැඩුනද, එකී සමාජයෙහි දක්නට ලැබුණු කිසිම අකටයුත්තකට දායක නොවූ පුද්ගලයෙකු ලෙස මෙතුමන් ජීවත් වූහ. මේ බව එම සමාජය විසින්ම එතුමන්ට පිළිගන්වනු ලැබූ නම්බු නාම වලින් මනාව පැහැදිලි වන්නේය. නිතරම තම සමාජයේ උන්නතිය හා සෞභාග්‍යය උදෙසා කටයුතු කරමින් හා සිතමින් තනිව සිට ප්‍රාර්ථනාවෙහි හා භාවනාවෙහි යෙදෙමින් කල් ගෙව්වෝය.

වසරේ සමහර කාලයන්හි මක්කමට නුදුරු ස්ථානයක පිහිටා තිබෙන "හිරා" නම් වූ ලෙන් ගුහාව තුළ නැවති නැමදුමෙහි හා වතාවත්වල නියැලෙමින් සිටීමට පුරුදු වී සිටියහ. එකී ස්ථානය හරහා ගමන් කළ යාචකයන් සමඟින් තමන්ගේ ආහාර පාන බෙදාගෙන අනුභව කිරීමට ද මෙතුමන් අමතක කලේ නැත.

රාමසාන් මාසයේ අග භාගයේ රැයක මෙලෙස රසූල් (සල්) තුමාණන් යාඥාවෙහි යෙදී සිටින විටදී, අග දේව දූතයාණන් වූ ජිබ්රීල් (අලෛ), නබිතුමාණන් ඉදිරියේ පෙනී සිට කියවනු ! යැයි පැවසීය. "මට කියවිය නොහැකියි. මා උම්මි (නූගත්)" යැයි නබිතුමාණන් පැවසූහ. පසු ජිබ්රීල් (අලෛ) නබිතුමාණන් වැළඳගෙන නැවතත් කියවනු ! යැයි පැවසූහ. එවිටද, පෙර කී පිළිතුරම එතුමන් ලබා දුන්හ. නැවත වතාවක් ජිබ්රීල් (අලෛ) නබිතුමාණෝ වැළඳ ගෙන "කියවනු"! යැයි පැවසූහ. ඉන්පසු රසූල් (සල්) තුමාණන්, ජිබ්රීල් (අලෛ) පවසන දේව වැකි එලෙසම පෙරලා පැවසූහ.

"(නබිවරයාණෙනි,) සියලු දෑ මවනු ලැබූ ඔබේ දෙවියාගේ නාමයෙන් කියවනු ! ඔහු "අලක්" (ලේ කැටියෙන්) මිනිසාව මැව්වේය. කියවනු ! ඔබ දෙවියා මහා පරිත්‍යාග වන්තයාය. ඔහු තෙලි තුඩින් ලිවීමට හුරු කෙරුවේය. තවද, (එමඟින්) මිනිසා නොදත් දෑ ඔහුට දැනගැනීමට සැලස්වූයේය." (96 : 1-5)

මෙය ප්‍රථම වහි (දේව වාක්‍යය) වන්නේය. මේ සමඟ මෙතුමන්ව මුළු මහත් මිනිස් සමාජයට ම තමාගේ දූතයෙක් ලෙස අල්ලාහ් පත්කර ගත්තේය, යන සුභාරංචිය ද සැලකර සිටියේ ය.

එකී සිද්ධියෙන් බොහෝ සේ කම්පනයට පත්වූ නබිතුමන් පෙරලා තම නිවසට පැමිණ වෙව්ලමින් "මා පොරවන්න", "මා පොරවන්න" යැයි තම භාර්යාව වූ කදීජා (රලි) තුමියට කියා සිටියහ. එතුමන් පොරවන ලදින් අනතුරුව මදක් සන්සුන්ව හිරා සිද්ධිය ගැන තම භාර්යාවට විස්තර කළහ. එලෙසම මෙය ෂෛතාන්ගේ හෝ යම් භූතයෙකුගේ ක්‍රියාවක් විය හැකි, යන සැකයක් ද මෙතුමන් හෙළි කළහ.

මෙය අසා සිටි කදීජා (රලි) තුමිය, “ඔබතුමා සැමදා යහපත් සිතුවිලි වලින් හා පරෝපකාරත්වයෙන් පිරිපුන්ය, දිළින්දන්, අනාථවූවන්, වැන්දඹුවන් හට සරණ වන්නෝය. එබඳු ගතිගුණ වලින් පිරිපුන් ඔබ වැනි කෙනෙකුට සර්ව බලධාරී දෙවියන් වහන්සේ කිසිදාක අත් නොහරින්නේය. ඔබ වෙත එල්ලවන ඕනෑම බලපෑමකින් ඔහු ආරක්ෂා කරන්නේය යැයි සනසා මේ පිළිබඳ සත්‍යතාවය දැනගැනීම පිණිස “වරකා බින් නව්ෆල්” නම් වූ එකල විසූ පඬිවරයා වෙතට කැඳවාගෙන ගියහ. එම පඬිවරයා පෙර පැවති ආගම්වල සඳහන් කරුණු සංසඳනය කොට බලා මෙතුමා දේව දූතයෙකු, යැයි ප්‍රකාශ කර සිටියේය. ඉන්පසු නබි (සල්) තුමාණන්ගේ ආගමික ප්‍රචාර කටයුතු ආරම්භ විය.

## අල් මිහිරාජ්

නබි (සල්) තුමාණන් තමා විසූ සමාජයෙන් එල්ල වූ නොයෙකුත් බලපෑම් හා තර්ජන හමුවේද තම ඉස්ලාමීය ප්‍රචාරක කටයුතු ඉදිරියට ගෙන ගියහ. නබීත්වයේ සිට වසර දහයක පමණ කාලයක් ආගමික ප්‍රචාරයේ දී තමාට ධෛර්ය ලබා දී සෙවනැලි මෙන් සිටි දෙදෙනෙකුගේ අභාවය මෙතුමන්ට ඉතා ශෝකජනක විය. මෙසේ කදීජා (රලි) තුමිය හා අබුතාලිබ් තුමාගේ අභාවයන් එක් වසර තුළම සිදුවීම එතුමාගේ කණස්සල්ලට හේතු විය. මෙලෙස ශෝකයට පත්ව කල්ගෙවූ අවධියක අල්ලාහ් නබිතුමාණන්ගේ සිත සැනසීම පිණිස මිඃරාජ් යැයි හඳුන්වනු ලබන අභ්‍යාවකාශ ගමන එතුමන්ට ලබා දුන්නේය.

නබි (සල්) තුමාණන් මිඃරාජ් ගමන ගැන විස්තර කරන්නෝය. “පෙරදා රාත්‍රියෙහි අල්ලාහ් මට මහත් ගෞරවයක් අත්කර දුන්නේය. මා නින්දේ පසු වුනෙමි. අග්‍රදේව දූතයා මා වෙත පැමිණ, කඃබාවේ මිදුලට මා කැඳවාගෙන ගොස්, එහිදී මගේ හදවත විවරකර එය සම්සම් දියෙන් සෝදා හැර මාගේ ගමන වෙනුවෙන් “බුරාක්” නැමති සත්වයාව සූදානම් කලේය. මා එහි නැග ගැනීමෙන් අනතුරුව එය ඉතා වේයෙන් “බෛතුල් මුකද්දසය” වෙත මා කැටුව ගියේය. එහි පිහිටා තිබෙන “මස්ජිදුල් අක්සාවෙහි” මම සලාතය ඉටු කළෙමි. පසුව එහි සිට අහස්තලයන් හතක් පසුකර අල්ලාහ්ගේ දේව සභාවට පිවිසුණෙමි. එය අතරතුර පෙර නබිවරුන් හා මලාඉකාවරුන් මුණ ගැසී ඔවුන්ට සලාම් කියා සුභ පැතුවෙමි. අල්ලාහ් සමඟ සංවාදයෙහි යෙදීමට මට භාග්‍ය ලැබුණි. මා ඔහුගෙන් පනස්කාල නැමැදුමක් ත්‍යාගයක් වශයෙන් ලද්දෙමි. පෙරලා පැමිණෙන විට අතර මගදී මූසා (අලෛ) තුමාගේ ඉල්ලීමකි මත පනස්කාල නැමදුම පියවරෙන් පියවර කෙටිකර පංචකාල නැමැදුමක් ලෙස අඩුකර ගත්තෙමි. තවද, ස්වර්ගයෙහි සැප හා නිරයෙහි වේදනාවන් ගැනද මට පෙන්වා දෙන ලදි. ඉන්පසු බෛතුල් මුකද්දසයට ළඟාවී අනතුරුව මක්කමට පැමිණියෙමු.

## හිජ්රත්

හිජ්රත් ගමන, නබි (සල්) තුමාණන්ගේ ජීවිත කාලයේ දී සිදුවූ තවත් වැදගත් සිදුවීමකි. මිඃරාජ් වලින් අනතුරුව ඉස්ලාම් වෙත එල්ලවන තර්ජන වැඩි වන්නට විය. මෙයින් මහත් සේ කම්පාවට පත්ව, මක්කම තවදුරටත් තම ප්‍රචාරක කටයුතුවලට නිසි තැනක් නොවන බව වටහාගෙන, ඒ සඳහා සුදුසු වූ පසුබිමක් සොයමින් තායිබ් නගරයට නබිතුමන් ගියහ. එම ප්‍රදේශයේ රසූලුල්ලාහ් බලාපොරොත්තු වූ පිළිගැනීමක් නොලැබුණි. මේ අතර මක්කාවට පැමිණෙන යත්රිබ් ප්‍රදේශයේ ද යාත්‍රිකයන්ට දේශනා කිරීමට අවස්ථාවක් නබිතුමාණන්ට ලැබුණි. මේ සමඟින් යත්රිබ් ප්‍රදේශයේ ඉස්ලාම් දහම කාලයත් සමඟම සීඝ්‍රයෙන් පැතිරෙන්නට විය. පසුව රසූල් (සල්) තුමාණන්ට යත්රිබ් වැසියන් සමඟ ගිවිසුමකට එළඹීමටද අවස්ථාව ලැබිණි. ඒ මක්කමට නොදුරු “අකබා” නම් ස්ථානයේ ය. මෙය “අකබා ගිවිසුම” නම් වේ.

“අකබා ගිවිසුම” අනුව රසූලුල්ලාහ්ට එහි පැමිණ ප්‍රචාරක කටයුතු කරගෙන යන ලෙසට ආරාධනාවක් ලැබිණි. අනතුරුව සහාබාවරුන් පියවරෙන් පියවර කොටස් වශයෙන් හා තනි තනිවද යවන ලැබුහ. අවසන් වරට තමාද යත්රිබ් බලා පිටත්වීමේ අරමුණෙන් අල්ලාහ්ගේ අනුමැතිය ලැබෙන තෙක් බලා සිටියහ.

මේ අතර, කුරෙෂි කාෆිර්වරුන්ට මේ ප්‍රවෘත්තිය සැලවීමෙන්, රසූල් (සල්) තුමාණන් පිටත් වීමට පෙර මරා දැමීමේ අදිටනින් එතුමාගේ නිවස රාත්‍රියෙහි වටලා රැකවල් ලා සිටියහ. නබිතුමාණන් ද මේ බව දැන සිටියේය. තම නිදි යහනෙහි අලි (රලි) තුමා නිදිකරවා, අල්ලාහ්ගේ අනුබලයෙන් කාෆිර්වරුන්ගේ දෑස්වලට නොපෙනී නිවසින් පිටත් වී අබූබක්කර් (රලි) තුමා ද කැටුව එදින රාත්‍රියේදීම මක්කමට නුදුරින් පිහිටි “තව්ර්” නම් ලෙන් ගුහාවට ළඟාවී එහි ලැගුම් ගත්හ. කාෆිර්වරුන් මේ දෙදෙනා ලුහුබැඳ ගියද ඔවුන්ගේ දෑසට නොපෙනෙන සේ, අල්ලාහ් එතුමාට ආරක්ෂාව සලසා දුන්නේය.

දින තුනක් එහි රැඳී සිටිමට ඔවුන්ට සිදුවිය. අවශ්‍ය වූ ආහාර පාන රහසිගතව ඥාතියෙකු විසින් සපයනු ලද්දේය. ඉන් පසුදා අළුයම නබි (සල්) තුමාණන් හා පිරිස මග පෙන්වන්නෙකුගේ සහය ඇතිව විකල්ප මාර්ගයකින් “යත්රිබ්” බලා පිටත් වූහ. යත්රිබ් වැසියන් මෙතුමන්ලාව ඉතා උත්කර්ෂවත් අන්දමට පිළිගත්හ. නබි (සල්) තුමා විසින් ඉස්ලාමීය රාජ්‍යයේ මධ්‍ය ස්ථානය ලෙස යත්රිබය තෝරා ගන්නා ලදි. එහි සිට ඉස්ලාමීය ධර්මය ලොවෙහි නන්දෙසටම පැතිරුනේය. යත්රිබ් පසුව මදීනතුන් නබි (නබිතුමාගේ නගරය) වී ඉන්පසු කටවහරට උචිත වන පරිදි “මදීනා” යැයි හඳුන්වනු ලැබීය.

<u>අභ්‍යාසය</u>

1. "හිජ්රත්" රසූල් (සල්) තුමාගේ ජිවිතයේ සන්ධිස්ථානයකි. මෙය පහදන්න.
2. "මිහිරාජ්" යනු නබි (සල්) තුමාට ප්‍රදානය කරන ලද ත්‍යාගයකි." පැහැදිලි කරන්න.

# 7.2 නබි (සල්) තුමාණන්ගේ මදිනා ජීවිතය

"යත්රිබ්" නම් යුදෙව් නායකයාගේ නමින් හඳුන්වන ලද "යත්රිබ්" නගරය නබි (සල්) තුමාගේ හිජ්රතයෙන් පසු "මදීනතුන් නබි" (නබිගේ නගරය) යනුවෙන් වෙනස් විය. මෙය කෙටියෙන් "අල්මදීනා" නමින් හැඳින්වේ.

නබි (සල්) තුමාගේ මදීනා හිජ්රතය ඉස්ලාමීය ඉතිහාසයේ ඉතා සුවිශේෂී හා වැදගත් සිද්ධියක් වශයෙන් සැලකේ. මෙම හිජ්රතය නබි (සල්) තුමාගේ ජීවිතයේ නව පෙරළියක් ද, ඉස්ලාමීය වර්ධනයේ උද්වේගයක් ද ඇති කෙළේය. මුස්ලිම්වරුන්ගේ දින දර්ශණය වන හිජ්රි වර්ෂය පටන් ගැණුනේ, මෙම සිද්ධියෙනි.

දුකෙන් හා පරාජයෙන් පිරි වර්ෂය හමාර වී ජයග්‍රහණයේ වර්ෂය උදාවිය, ජනතාව විසින් පිළිකුලට ලක් වූ අයෙකු වශයෙන් මක්කාව හැර ගිය නබි (සල්) තුමා උතුම් නායකයෙකු ලෙස මදීනාවට පිවිසුණහ. මදීනාවේ සියල්ලෝම ඉස්ලාම් වැළඳගත් අතර මක්කාවෙන් පැමිණි මුහාජිර්වරුන්ට නැවතී සිටීමට නිවාස, භාණ්ඩ, ඉඩම් යනාදි සියල්ල ලබා දී උදව් කළහ. එම නිසා නබි (සල්) තුමා එම මදීනා වැසියන් "අන්සාර්" (උදව්කරුවන්) යනුවෙන් නම් කර ගරු කළහ. මුහාජිවරුන් මදීනාවේ විසූ අන්සාර්වරුන් සමඟ සහෝදරවරුන් වශයෙන් බැඳීමක් ඇති කළහ. මදීනා ජනතාව නබි (සල්) තුමන් තම නායකයා වශයෙන් පිළිගෙන ඔහුගේ වචනයට ගරු කළහ. මක්කාවේදී ආගමික දේශකයෙකු වශයෙන් පමණක් සේවය කළ නබි (සල්) තුමා, මදීනාවේ පාලකයෙකු වශයෙන් එම නගරවැසියන් විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මානව ඉතිහාසයේ හෙතෙම අසහාය ස්ථානයක් හිමිකර ගැනීමේ බීජය මෙම භූමියේ වපුරන ලදී.

එතුමා "මස්ජිදුන් නබවී" නම් දෙව් මැදුරක් තැනූහ. දේශනා මදීනාවේ ආගමික, සමාජීය, දේශපාලන මධ්‍යස්ථානයක් ලෙස මස්ජිදුන් නබවී ක්‍රියාත්මක විය. මෙහිදී එතුමා අල්ලාහ්ට ළඟාවන මාර්ගය ගැන ද සාමය, සහෝදරත්වය වැනි උතුම් සිද්ධාන්තය ගැන ද දේශන කළහ. කුල ආඩම්බරය, මීනීමැරීම, උන්මාදය වැනි දුර්ගුණ ද ජනතාව අතර පැවති බෙදීම් ද තුරන් කර ඔවුන් ඉස්ලාම් නම් ධජයක් යටතේ එකමුතු කළහ. අවුස් හා කස්රජ් ගෝත්‍රිකයින් අතර පරම්පරා ගණනක් පැවැති සතුරුකම සුහදව විසිදා දුන්හ. මෙසේ මදීනා අවට පෙදෙසේ ජීවත් වූ ගෝත්‍රිකයින් සමඟ ගිවිසුමක් ඇති කරගෙන එකමුතු වූහ. මේ ආකාරයට මදීනාවේ දී විශාල ප්‍රතිසංස්කරණ විප්ලවයක් නබි (සල්) තුමාගේ නායකත්වයෙන් ඇති විය. මෙවැනි කටයුතු නබි (සල්) තුමාණන් ධර්ම දේශකයකු ලෙස පමණක් නොව සමාජ නායකයෙකු වශයෙන් ද උසස් කෙළේය. එම නිසා සමාජයේ ආගමික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා ආරක්ෂක අවශ්‍යතා සියල්ල කෙරෙහි අවධානය යොමු කිරීමේ වගකීම එතුමන්ට පැවරිණි. මදීනාවෙහිදී තම තත්ත්වය ස්ථිර කර ගත් පසුව යහපත් ආණ්ඩුවක පිහිටු වූහ. යුක්තිය, සාධාරණත්වය, විනය, අවනත භාවය යනාදිය මෙම ආණ්ඩුවට පදනම් වී තිබිණි.

නබි (සල්) තුමාණෝ යහපත් ආණ්ඩුවක් පිහිට වූ විට ගිවිසුමක් ප්‍රකාශයට පත් කළහ. මෙම ගිවිසුම මගින් සියළු වාර්ගික සතුරුකම් අහෝසි කරන ලද අතර සියළු දෙනාටම ප්‍රජා අයිතිවාසිකම් පිරිනමන ලදී. මෙම ව්‍යවස්ථාවට යුදෙව්වරුන් හා ක්‍රිස්තියානි භක්තිකයින් අන්තර්ග්‍රහණය කරන ලදී. මුස්ලිම්වරුන්ට පිරිනමන ලද එම අයිතිවාසිකම් ඔවුන්ට ලබාදෙන ලදී.

පසු කාලයේදී විශ්ව ඉස්ලාමීය අධිරාජ්‍යයක් බිහිවීමට, අඩිතාලමක් මස්ජිදුන් නබවි නම් දෙව් මැදුරේ දී දමන ලදී. මෙහි දී මුස්ලිම්වරුන් සලාතයට කැඳවීම සඳහා "අදාන්" ක්‍රමයද නබි (සල්) තුමාණන් විසින් හඳුන්වා දෙන ලදි. අල්ලාහ්ගේ අණ පරිදි "බෛතුල් මුකද්දස්ය" ට මුහුණලා තිබූ සලාතයේ "කිබ්ලා" නම් දිසාව "කඃබාව" දෙසට මාරු කරන ලදී. අනිවාර්ය සවිම් සමාදන්වීම සඳහා රමළාන් මාසය නිර්ණය කරන ලදි. "ඊදුල් ෆිතර්" සහ "ඊදුල් අල්හා" සඳහා වූ දින, උත්සව දින වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි. මෙම වෙනස්කම් සියල්ල සිදුවුයේ අල්ලාහ්ගේ අණ පරිදිය.

ඇත්ත වශයෙන්ම මෙය ලෝක ඉතිහාසයේ ඉතාමත් පුදුම සහගත, කවරදාකවත් සිදු නොවූ විප්ලවීය ජයග්‍රහණයකි. එහෙත් නබි (සල්) තුමාගේ මානව විප්ලවය, ආගම හා දේශපාලනය පමණක් නොව ලෞකික හා ආධ්‍යාත්මික ජිවිතයේ සෑම අංගයක්ම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සිදු වුවකි.

මදීනාවේ නබි මුහම්මද් (සල්) තුමාණෝ ලබා ගත් ජයග්‍රහණය නිසා මක්කා කුරෙෂිවරුන් දෙදරීමට පත්වූ අතර ඔවුන්ගේ සාමකාමී බව ද අහිමි විය. නබි (සල්) තුමාණන් මදීනාවේ නායකත්වයට පත්වීම ද දිනෙන් දින ඉස්ලාමීය විප්ලවය වර්ධනය වීමක් ලෙස ඔවුන් දුටුහ. මදීනාවේ වර්ධනය වන ඉස්ලාමීය ආධිපත්‍යය නිසා මක්කා කුරෙෂිවරුන්ට බලවත් අනතුරක් සිදුවිය හැකි යැයි ඔවුන් විශ්වාස කළහ. එම නිසා මදීනාවේ පිහිටුවන ලද ඉස්ලාමීය රාජ්‍යය මුලිනුපුටා දැමීමට ඔවුහ තිරණය කළහ. මෙම තිරණය යුද්ධයෙන් අවසන් විය. මෙම අවස්ථාවේ දී හිජ්රි 1 වෙනි වර්ෂයේ අවසානයේදී දිනක් ආත්මාරක්ෂාව වෙනුවෙන් යුද්ධය කිරීමට අවසර දී නබි (සල්) තුමන්ට අල්ලාහ් විසින් අල්කුර්ආන් වැකි පහළ කරන ලදී. "සුරතුල් අන්ෆාල්" පුරාම බද්ර් යුද්ධයේ විමර්ශනයක් සඳහන් වේ.

ඉස්ලාමීය ඉතිහාසයේ පැවැති පළමුවෙනි යුද්ධය බද්ර් යුද්ධය වේ. බද්ර් නම් ස්ථානයේ නබි (සල්) තුමාගේ නායකත්වයෙන් යුත් මුස්ලිම්වරුන් 313 දෙනෙකුගෙන් සමන්විත කුඩා කණ්ඩායමක් ආයුධ සන්නද්ධ සතුරන් 1000 දෙනෙකු සමඟ සටන් වැදී ජය ගත්හ. මෙම සටන ඉස්ලාමීය ඉතිහාසයේ නව සන්ධිස්ථානයක් වූ අතර විශාල පරිවර්තනයක් ද ඇති කළේය. ඉස්ලාම් නම් සත්‍ය මාර්ගය අසත්‍යය හා සටන් වැද ජයග්‍රහණය කෙළේය. අඥානකමේ ආධිපත්‍යයට මිනී වළක් කපන ලදී. ළමා අවධියේ තිබූ ඉස්ලාමය, සීඝ්‍ර වර්ධනය කරා ගෙන ගිය අතර එහි පිළිගැනිම අරාබි දේශය පුරාම තහවුරු කෙළේය. මුස්ලිම්වරුන්, නබි (සල්) තුමන් මත විශ්වාසය තවදුරටත් බලවත් විණි. මදීනාවේ ජිවත් වූ මුස්ලිම්වරුන් හිස කෙළින් තබා ජිවත් වුහ. බද්ර් ජයග්‍රහණය මුස්ලිම්වරුන් පසු කාලයේ දී ලබා ගත් සියළු ජයග්‍රහණයන්ට පදනමක් විය.

කුරෙෂිවරුන් බද්ර් යුද්ධයේ දී තමන් ලද පරාජය නිසා මුස්ලිම්වරුන්ගෙන් පළිගැනීමට උත්සහා කළහ. එපමණක් නොව බද්ර් යුද්ධයෙන් පසුව බොහෝ දෙනෙක් සිය කැමැත්තෙන්ම ඉස්ලාමය වැළඳගැන්ම තුළන් ඇති වූ කුරෙෂිවරුන්ගේ ඊර්ෂ්‍යාව නිසා ඔවුහු, මුස්ලිම්වරුන්ට හිස ඔසවීමට බාධා කරන්නට වුහ. එම නිසා 3000 ක ගෙන් සමන්විත සතුරු සේනාවක් මදීනාව කරා පැමිණියේ ය. එහි සිට උතුරින් පිහිටි "උහද්" නම් කඳු වැටියේ කඳවුරු බැඳගත්හ. නබි (සල්) තුමාණෝ 1000 දෙනෙකුගෙන් සමන්විත සේනාවක් සමඟ "උහද්" කඳුවැටිය කරා ගියහ. වංචනිකයින්ගේ නායකයා, නබි (සල්) තුමන්ට චෝදනා එල්ල කරමින් තමාගේ යුදෙව් අනුගාමිකයින් 300 දෙනෙකු කැටුව නැවත මදීනාවට ගියේය. මේ නිසා 700 ක් පමණ මුස්ලිම්වරුන් යුද්ධයට සහභාගී වුහ. මෙම යුද්ධයේ දී නබි (සල්) තුමන්ට ද පහර වැදුනු අතර එතුමන්ගේ දතක් ද කැඩුණි. මුලදී මුස්ලිම්වරුන්ට වාසි වුවද අවසානයේ දී ඔවුන්ට අවාසි විය. එය මුස්ලිම්වරුන්ට පාඩමක් විය. එනම්, මුස්ලිම්වරුන් නායකත්වයට අවනතවීම වැදගත්ය යන්න, අවධාරණය කරයි. තවද, ධනයට වඩා ඉස්ලාම් වැදගත් බව ඉගැන්විය. මදීනවේ සිටි සමයේ දී මුස්ලිම්වරුන්ගේ ආධාරකරුවන් ලෙස රඟපාන ලද යුදෙව්වරුන් ඉස්ලාමයේ හතුරන් බව අනාවරණය කෙළේය. එසේම ජයග්‍රහණයේ දී හා පරාජයේ දී මුස්ලිම්වරුන්ගේ නොසැලී සිටීම යන ගුණාංගය, එයින් තහවුරු විය.

එහෙත් බනු කෙනුකා, බනු නලීර් සහ බනු කුරෙළා යනාදි යුදෙව් ගෝත්‍රිකයින් තෙගොල්ලන්ම එකතු වී මුස්ලිම්වරුන් අතර සුළු සුළු ප්‍රශ්න මතුකර කලබල ඇති කළහ. ඉස්ලාමය මුලිනුපුටා දැමීමේ කාර්යයේ ද රහසිගතව යෙදුනහ. යුදෙව්වරුන් මුස්ලිම්වරුන්ට පක්ෂ බව පෙන්වමින් ප්‍රශ්ණ ඇති කළහ. මොවුන් සමඟ සාමයෙන් සිටීමට නබි (සල්) බොහෝ අවස්ථාවල උත්සහා කළ ද එය ඉෂ්ඨ නොවිය.

පසුව යුදෙව්වරුන් "කෛබර්" නම් ස්ථානයට පිටුවහල් කරනු ලැබූහ. එසේ පිටුවහල් කරනු ලබුවන්ගේ ඇවිස්සීමෙන් 10,000 දෙනෙකුගෙන් සමන්විත සතුරු සේනාවක් මදීනාව විනාශ කිරීමේ අරමුණින් පැමිණියහ. එම නිසා මෙම මහා සතුරු ශක්තිය සමඟ විවෘත පිට්ටනියක සටන් වැදීම නුසුදුසු බව අදහස් කළ නබි (සල්) තුමන් තම සහාබාවරුන් සමඟ සාකච්ඡාවක යෙදුනහ. සල්මානුල් ෆාර්සී (රලි) තුමාගේ උපදෙස් අනුව මදීනා නගරය වටා අගලක් හාරන ලදී. මෙය මදීනාවට ඇතුළු වීමේ දී සතුරන්ට බාධාවක් විය. මෙම සටනට මුස්ලිම් සේනාවේ 3000 දෙනෙක් සහභාගි වූහ. මෙය හිජ්රි 05 දී සිදුවිය. මෙය "කණ්ඩායම් යුද්ධය" නමින් ඉතිහාසයේ හඳුන්වන ලදී. මෙයට හේතුව මක්කා කුරෙෂිවරුන් පමණක් නොව මදීනාවෙන් පිටුවහල් කරනු ලැබූ ගෝත්‍ර ද මෙයට සහභාගි වීමයි. තවද, මෙය "කන්දක් යුද්ධය", "අහ්සාබ් යුද්ධය" කන්දක් යුද්ධය (අඟල් සටන), අහ්සාබ් යුද්ධය (කණ්ඩායම් සටන) නමින් ද හැඳින්වේ. අවසානයේ දී මුස්ලිම්වරුන්ට ජය හිමි විය.

ඉස්ලාමයේ වර්ධන කාල වකවානුවේදී නබි (සල්) තුමන් මුස්ලිම්වරුන් සමඟ ද යුදෙව්වරුන් සමඟ ද කුරෙෂිවරුන් සමඟ ද වෙන වෙනම ගිවිසුම කිහිපයක් කර ගත්හ. මේවා ඉස්ලාමයේ වර්ධනයට විවිධාකාරයෙන් සහාය විය. එහෙත් නැවතත් යුදෙව්වරුන් කෲරකම් කළහ. මෙවැනි යුදෙව්වරුන්ගේ කෲරකම් මැඩ පැවැත්වීමේ එකම මාර්ගය වුයේ යුද්ධයයි. එම නිසා හිජ්රි 7 දී කෛබර් යුද්ධය ද හිජ්රි 9 දී තබුක් යුද්ධය ද සිදුවිය.

**හුදෛබියා ගිවිසුම :**

නබි (සල්) තුමාණන් විසින් කරන ලද ගිවිසුම අතර "හුදෛබියා ගිවිසුම" ප්‍රධාන තැනක් ගනී. මෙම ගිවිසුම හිජ්රි 6 වෙනි වර්ෂයේ දී මුස්ලිම්වරුන් හා කුරෙෂිවරුන් අතර ඇති කර ගන්නා ලදි.

නබි (සල්) තුමා ද සහබාවරුන් 1400 දෙනා ද උම්රා වතාවත් ඉටු කරනු පිණිස මක්කාව කරා පිටත් වුහ. මෙසේ ඔවුන් මක්කාවට පැමිණෙන බව දැනගත් කුරෙෂි කාෆිර්වරු, මුස්ලිම්වරු මක්කවට ඇතුළු වීම වැළැක් වුහ. "හුදෛබියා" නම් ළිඳ අසල මුස්ලිම්වරු නතර වී, මක්නාවට ඇතුළු වීමට අවසර ඉල්ලා, නබි (සල්) තුමා විසින් උස්මාන් (රලි) තුමාව මක්කාවට යැවුහ. උස්මාන් (රලි) තුමා මක්කාවේ සිට නැවත ඒමට ප්‍රමාද වීම හේතුවෙන් කුරෙෂීවරු එතුමාව ඝාතනය කරන ලද්දේ ද යන්න සැක පහළ විය. එවිට නබි (සල්) එම ස්ථානයේ රැඳි සිටි සියලු සහභාවරුන්ගෙන් "බෛආන්" ලවා ගත්හ. උස්මාන් (රලි) තුමා වෙනුවෙන්, නබි (සල්) තුමා තම වම් දෑත දකුණු දෑත මත තබා "බෛඅන්" කළහ. එය "බෛඅතුල් රිල්වාන්" යදුමෙන් හඳුන්වනු ලබයි.

පසුව උස්මාන් (රලි) තුමා පැමිණි පසු නබි (සල්) තුමා හා කුරෙෂීවරු අතර ගිවිසුමක් ඇති විය. "හුදෛබියා" නම් ළිඳ අසල සිදු වු බැවින් එය "හුදෛබියා ගිවිසුම" යනුවෙන් හඳුන්වනු ලබයි.

මෙහි වැදගත් කරුණු :

I. දෙපාර්ශවයම අවුරුදු 10 කට සටන් නොවැදීම.

II. බියෙන් තොරව දෙපාර්ශවයම රටේ ජීවත්වීම.

III. මුස්ලිම්වරුන් මෙම වර්ෂයේදී මක්කාවට නොපිවිසිය යුතුයි. මීළඟ වර්ෂයේදී මක්කාවට පැමිණී නිරායුධව දින තුනක් රැඳී සිටිය හැකිය. එම තෙදිනම කුරෙෂ්වරුන් මක්කාවෙන් පිටත්ව සිටිති.

IV. කුරෙෂ්වරුයෙකු අවසර නොමැතිව මදීනාවට පැමිණියහොත් ඔහු ආපසු එවිය යුතුයි. නමුත් මුස්ලිම්වරුන්ගෙන් කිසිවෙකු කුරෙෂිවරුන් වෙත (මක්කාවට) පැමිණිය හොත් ඔවුන් නැවත එවනු නොලැබේ.

V. දෙපාර්ශවයම තම තමන්ට අයත් වෙනත් ගෝත්‍ර සමඟ සාම ගිවිසුම ඇති කර ගත හැකිය. එහෙත් කුරෙෂිවරුන්ගේ මිතුරු පාර්ශවයට මුස්ලිම්වරුන් විරුද්ධ විය නොහැකිය. එසේම මුස්ලිම්වරුන්ගේ මිතුරු පාර්ශවය කුරෙෂිවරුන් විසින් පහර දීමට ලක් නොකළ යුතුය.

යනාදී කොන්දේසි ඉදිරිපත් වී තිබිණි.

**මක්කා ජයග්‍රහණය :**

හුදෙබියා ගිවිසුම උල්ලංඝනය කරමින් කුරෙෂිවරුන්ගේ මිතුරු පාර්ශවය වන "බක්ර්" ගෝත්‍රිකයින්ගෙන් ඇතැමෙකු විසින් මුස්ලිම්වරුන්ගේ මිතුරු පාර්ශවය වන "කුසාආ" ගෝත්‍රිකයන්ව කෲර ලෙස ඝාතනය කරන ලදී. පසුව මක්කා වැසියන් පිළිගත හැකි හේතුවෙන් ඉදිරිපත් නොකර යුද්ධයට පැමිණෙන ලෙස අඬ ගැසුහ.

හිජ්රි 08 වෙනි වර්ෂයේ දී නබි (සල්) තුමා මුස්ලිම්වරුන් 10,000 ක් සමඟ ගොස් රුධිරය නොහෙළා මක්කාව අත්පත් කරගත්හ. එහි සිටි අයට විවෘත හදවතකින් සමාව දුන්හ. එහි හිස නමා සිටි සියලු කුරෙෂිවරුන් බලා, නබි (සල්) තුමන් "සහෝදරවරුනි, ඔබ මාගෙන් කුමක් බලාපොරොත්තු වන්නේ ද?" යයි ඇසූ විට, ඔවුන් සියල්ලෝම "ඔබ උතුම් සහෝදරයෙක්, උතුම් සහෝදරවරයෙකුගේ පුත්‍රයෙක්" බව පැකිළීමකින් තොරව ක්ෂණිකව පිළිතුරු දුන්හ. 18 වෙනි වියේ පසු වූ "ඉතාබ් ඉබ්නු අස්යද්" නැමැත්තාව මක්කාවේ ආණ්ඩුකාරවරයා බවට පත් කරමින් නබි (සල්) තුමාණන් ද සහාබාවරුන් ද මදීනාවට ගියහ. "අබූ සුෆ්යාන්" ඔහුගේ පුත් මුආවියා, අබූබක්කර් (රලි) තුමාගේ පියා අබූ කුහාෆා වැන්නන් මක්කා ජයග්‍රහණය අවස්ථාවේ දී ඉස්ලාමය වැළඳ ගත්හ.

හිජ්රි 10 දී "බරාඅත්" නම් අල්කුර්ආන් වාක්‍ය මගින් ආදේශ කිරීම සම්පූර්ණයෙන්ම නැති කළහ.

## නබි (සල්) තුමාගේ අවසන් හජ් දේශනය

හිජ්රි 10 දී නබි (සල්) තුමාණෝ මදීනාවේ සිට හජ් වන්දනාව ඉටු කිරීම පිණිස මක්කාවට යෑම සඳහා පිටත් වූ විට ලක්ෂ සංඛ්‍යාත මුස්ලිම්වරුන් ද එතුමන් සමඟ ගියහ. අරාබියාවේ විවිධ ප්‍රදේශවලින් ලක්ෂයකටත් අධික ජනතාව ගියහ. හජ්හි වතාවන් අදියරෙන් අදියරට ඉටුකර පෙන්වූ නබි (සල්) තුමන් දුල්හජ් 9 වෙනි දින අරෆා පිටියට සෙන්දු වූහ. එවිට විශාල ජන ගංගාවක් මැද නබි (සල්) තුමා ජබලුර් රහ්මා නම් කඳු පාමුල සිට තම ඔටුවා මත හිඳ ඓතිහාසික වැදගත් කථාවක් පැවැත් වූහ. "හජ්ජතුල් විදා" හෙවත් අවසාන හජ් යනුවෙන් හැඳින්වනුයේ මෙයයි. එය ලුහුඬින්,

> "ජනතාවනි, මගේ වදන්වලට පරිස්සමින් සවන් දෙන්න. මෙම දවසත් මෙම මාසයත් ශුද්ධ වූ සේම ඔබගේ ජීවයත් දේපළත් ගෞරවයත් අවසාන දිනය දක්වා ම ශුද්ධ වූ දේවල්ය. නිශ්චිතව ම ඔබ සියලු දෙනාම ඔබේ දෙවියන් හමුවන්නෝය. ඔබගේ ක්‍රියාවලට ඔබ පිළිතුරු දිය යුතුව ඇත. අවදානමෙන් සිටින්න. ඔබ අතර වරදක් කරන සෑම කෙනෙකුම තමන්ම එම වරදට වගකිව යුතුයි. පියා පුතාගේ වරදට හෝ පුතා පියාගේ වරදට හෝ වගකිව යුත්තා නොවේ"
>
> "අද සිට ඔබ සදහටම පොළිය නොගන්න. මගේ බාප්පා වන අබ්බාස්ට ඔබ ගෙවිය යුතු පොළිය ද මම අහෝසි කෙළෙමි. අඥාන කාලයේ පැවැති පළිගැනීමේ සිරිත මින් පසු පැවැතිය නො යුතුය."
>
> "ජනතාවනි, ඔබගේ රටේ තම ආධිපත්‍යය තහවුරු කිරීමට නොහැකි වූ ෂෙතාන් හිත් වේදනාවෙන් සිටියි. ඔබ අල්ප දෙයකට හෝ ඔහුට අවනත වුවා නම් ඔහු සොම්නසට පත්වේ. එම නිසා නැමදීමට සුදුස්සා එකම දෙවියාය, යනුවෙන් ඔබ දරන විශ්වාසය ගැන ඉතා අවදානමෙන් සිටින්න"
>
> "මාගේ වදන්වලට සවන් දෙන්න. ඔබගේ දෙවියන්ව නමදින්න. පංචකාල සලාතය ඉටුකරන්න. රමළාන් මාසයේ සව්ම් සමාදන් වන්න. කෑබාවට පැමිණ හජ් වතාවත් ඉටුකරන්න. ඔබගේ වත්කමින් නිර්ණය කරන ලද සකාත් බද්ද ප්‍රදානය කරන්න. මා පවසන අණ ඉටුකරන්න. එසේ කරන්නේ නම් ස්වර්ගයට යන්නෙහු. මගෙන් පසුව ඔබ නොමඟ නොයන්න. එසේ නොමග යන්නේ නම් ඔබ එකිනෙකාගේ ගෙල කපාගන්නා තත්ත්වයක් මතුවේවි"
>
> "අද මම ඔබ ඉදිරියේ දෙකක් හැර යන්නෙමි. ඒවා තදින් බැඳගන්න තාක් කල් ඔබ නොමග නොයන්නෙහු. ඒවා නම් අල්ලාහ්ගේ ආගම (අල්කුර්ආන්) සහ ඔහුගේ දූතයාගේ ආදර්ශය යි."
> (සුන්නා)

මෙය නබි (සල්) තුමාණෝ 124,000 ක සහබාවරුන් මැද පැවැත්වූ කථාව පමණක් නොව මුස්ලිම්වරුන් සඳහා වූ ප්‍රකාශයක් ලෙස ද නබි (සල්) තුමාගේ රිසාලත් මෙහෙවරයේ සාරාංශයක් ලෙස ද පවතී.

එම නිසා නබි (සල්) තුමාගේ අවසාන හජ් දේශනය ඉතිහාසයේ ඉතා වැදගත් තැනක් උසුලයි. මුස්ලිම්වරුන්ගේ ජීවිතයට සුවිශේෂිව පවත්වන ලද නබි (සල්) තුමාගේ ඉගැන්වීම් ගැන මෙම දේශනයෙන් සිහිපත් කෙරේ. නබි (සල්) තුමන් දැරූ පරමාදර්ශ සමාජය පිළිබඳ අදහස් ද සහෝදරත්වය පදනම් කොට ගෙන පිහිටි සමාජයේ දර්ශනය ද මෙම දේශනයෙන් ප්‍රකාශ කර ඇත.

දේශනයෙන් අනතුරුව නබි (සල්) තුමන් මදිනාවට පැමිණි විට අසනීපය ද එතුමන් ලුහුබැන්දේය. අවසානයේ දී හිජ්රි 11 වෙනි වර්ෂ රබිඋල් අව්වල් හඳ 12 දී තම 63 වෙනි වියේදී මෙලොව ජීවිතය හැර ගියාහ. (ඉන්නා ලිල්ලාහි ව ඉන්නා ඉලෛහි රාජිඌන්)

| සමහර වැදගත් සිදුවීම් | සිදුවූ හිජ්රි වර්ෂ |
|---|---|
| බද්ර් යුද්ධය | හි - 2 |
| උහද් යුද්දය | හි - 3 |
| අගල් යුද්ධය | හි - 5 |
| හුදෛබියා ගිවිසුම | හි - 6 |
| කෛබර් යුද්ධය | හි - 7 |
| මක්කා ජයග්‍රහණය | හි - 8 |
| තබූක් යුද්ධය | හි - 9 |
| හජ්ජතුල් විදා | හි - 10 |
| නබි (සල්) තුමාගේ වියෝව | හි - 11 |

අභ්‍යාසය

1. නබි (සල්) තුමාගේ මදිනා ජීවිතයේ සිදු වූ වැදගත් සිද්ධීන් වගුගත කරන්න.

සුදුසු වචන යොදා හිස් තැන් පුරවන්න.

1. හිජ්රතය නබි (සල්) තුමාගේ ජීවිතයේ .............................................. ඇති කෙළේය.
2. මුස්ලිම්වරුන්ගේ ලිත .............................................................. සිද්ධියෙන් පටන් ගනී.
3. මක්කාවේ සිට පැමිණි මුහාජිර්වරුන්ට ........................................... සියළු දේම පිරිනමා උදව් කළහ.
4. නබි (සල්) තුමා මදිනාවේ .................................................................................. එම නගර වැසියන් විසින් ප්‍රකාශයට පත් කරන ලදී.
5. නබි (සල්) තුමා අල්ලාහ්ට ළඟාවන ................................................... සහෝදරත්වය වැනි උතුම් සිද්ධාන්තය ගැනත් දේශනා කළහ.
6. බද්ර් යුද්ධයේ විමර්ශනයක් ලෙස සුරතුල් ................................................................ පහළ කරන ලදී.

පිළිතුරු සපයන්න.

1. නබි (සල්) තුමන් ජනතාව ඉස්ලාම් නම් එකම ධජය යටතේ ගෙන ඒමට හේතු මොනවාද?
2. අගල් යුද්ධයට අගල් කැපීමට යෝජනා කළ අයගේ නම කුමක් ද?
3. නබි (සල්) තුමන් කව්රුන් සමඟ ගිවිසුම් ඇතිකර ගත්තේ ද?
4. හුදෛබියා ගිවිසුම සිදුවීමට හේතුව කුමක් ද?
5. මදිනාවේ විසූ යුදෙව් ගෝත්‍රවල නම් සඳහන් කරන්න.
6. ගිවිසුම් නිසා මුස්ලිම්වරුන් ලැබූ ජයග්‍රහණය මොනවාද ?
7. හිජ්රතයෙන් පසු මුස්ලිම්වරුන්ට ඇතිවූ වාසි සහගත ප්‍රතිඵල සඳහන් කරන්න.

## 7.3 උම්මහාතුල් මූ:මිනින් (විශ්වාසවන්තයින්ගේ මැණියෝ)

නබි (සල්) තුමා තම විසිපස් වෙනි විය දක්වා කිසිදු කාන්තාවක් සමඟ විවාහ නොවූහ. විසිපස් වෙනි වියේදී කදීජා තුමිය විවාහ කර ගත් පසු තම 50 වෙනි විය දක්වා එතුමිය සමඟ පමණක් ජීවත් වූහ. පසුව තම මහළු වියේ දී රාගික චේතනාවෙන් නොව එතුමාගේ පරිත්‍යාගශීලි බව නිසාද, ආදරය නිසාද කුඩා අවධියේ සිට ගුණ දහම් වලින් පිරි පැවතීම නිසාද, විවිධ මාර්ග වලින් ඉස්ලාමයට උදව් ලබා ගැනීමටත් අසරණ වී සිටි කාන්තාවට පිහිට වීමටත්, විවිධ වූ සාධාරණ හේතූන් නිසාත් සව්දා (රලි), ආයිෂා (රලි), හෆ්සා (රලි), සෛනබ් බින්ත් හුසෛමා (රලි), උම්මු සල්මා (රලි), සෛනබ් බින්ත් ජහ්ෂ් (රලි), ජුවෛරියා (රලි), උම්මු හබිබා (රලි), සෆියියා (රලි), මෛමූනා (රලි) යන පිවිතුරු කාන්තාවන් එකළොස් දෙනෙකු විවාහ කර ගත්හ. මෙම භාර්යාවන්ට “උම්මහාතුල් මූ:මිනීන්” යනුවෙන් හඳුන්වනු ලැබේ.

නබි (සල්) තුමාගේ පළමු බිරිඳ කදීජා (රලි) තුමියයි. “උම්මුහින්ද්” යනු එතුමියගේ අන්වර්ත නාමයයි. “තාහිරා” (පාරිශුද්ධ වන්තිය) යනු එතුමියගේ විශේෂ නාමයයි. නබි (සල්) තුමා තම විසිපස් වෙනි වියේ දී විවාහ වන විට මෙතුමියගේ වයස අවුරුදු හතලිහකි. කදීජා තුමියගේ යහගුණ, යහපත් චරිතය හා එතුමිය තමන්ට කැමැත්තක් දැක්වීම සමඟ එතුමිය සතුව තිබූ විශාල ධනය ඉස්ලාමීය මෙහෙවරයට උපකාරී වන නිසා නබි (සල්) තුමා කදීජා තුමිය හදවතින්ම පිළිගත්හ. නබි (සල්) තුමාණන්ට දූ දරුවන් සය දෙනෙක් ලැබුණේද මෙතුමිය මගිනි. සෛනබ්, රුකෛයා, උම්මු කුල්දූම්, ෆාතිමා නම් දැරියන් ද කාසිම්, අබ්දුල්ලාහ් නම් දරුවන්ද මෙලෙස ඉපදුනහ. නබි (සල්) තුමා නබිවරයෙක් බව කදීජා (රලි) තුමිය මුළුමනින්ම විශ්වාස කළාය. එම නිසා එතුමාගේ කාර්යවලට මෙතුමිය සහාය වූවාය. හිරා ගුහාවෙහි නබි (සල්) තුමා දින ගණනක් තිස්සේ ධ්‍යානයෙහි යෙදී සිටියදී ආහාර හා පානය රැගෙන ගියාය. අල්-කුර්ආනය පහළ වූ ප්‍රථම සිද්ධියේ දී උණෙන් පෙළෙමින් නිවසට පැමිණි නබි (සල්) තුමන් තමන් බිය වී ඇතැයි පැවසූ විට “බිය නොවන්න, නියත වශයෙන්ම මෙය අල්ලාහ් ඔබ සමඟ සබඳතා පැවැත්වූ සිද්ධියයි. අල්ලාහ් ඔබ අත්නොහරියි” යනුවෙන් අස්වැසුවාය. “ෂි:බු අබූතාලිබ්” නම් ප්‍රදේශයක නබි (සල්) තුමාට සහ හාසිම් පවුලේ අයට අවුරුදු තුනක් සම්බාධක පනවා තිබූ සමයේ දී කදීජා (රලි) තුමිය ද ඊට සහභාගි වී තම ධනය සියල්ල වියදම් කළාය. අවුරුදු 25 ක් තිස්සේ එකම බිරිඳක් ලෙස නබි (සල්) සමඟ ජීවත් වූවාය. කදිජා (රලි) තුමිය ජීවත්ව සිටියදී මක්කා කාෆිර්වරු නබි (සල්) තුමන්ට කිසිම හානියක් කිරීමට එඩිතර නොවීම තුළින්ම නබි (සල්) තුමාගේ භායයීවගේ තත්ත්වය මනාව වැටහේ.

කදීජා (රලි) තුමිය මිය යෑමෙන් පසුව නබි (සල්) තුමා කුඩා දරු දැරියන් සමඟ වෙහෙස මහන්සි වී සිටියදී ගැහැණු ළමයින් හදා වඩා ගැනීම සඳහා සව්දා (රලි) තුමිය සමඟ විවාහ වූහ. ඉස්ලාමයේ මුල් කාලයේදීම මෙතුමිය ඉස්ලාම් වැළඳගෙන සිටියාය. නුබුව්වත් වර්ෂ 10 දී දිර්හම් 400 ක මහර් පිරිනමා ඇය විවාහ කර ගත්හ. සාමාන්‍ය, චාම්, ළමා මනසින් යුතු ගුණාංග මෙතුමිය තුළ විය. දන් දීමෙහි හා පරිත්‍යාගශීලි බවෙහි ඉහළ තැනක් දැරුවාය. නබි (සල්) තුමාගේ දරු දැරියන් තමන් සතුව භාර දෙන ලද සුරැකුම් වස්තූන් බව සිතා නඩත්තු කළාය. නබි (සල්) තුමන් අඩු වයසක සිටි ආයිෂා (රලි) තුමිය සමඟ විවාහ වූ විට එතුමිය ගැන බලා ගත්තේ ද සව්දා (රලි) තුමියයි. සව්දා (රලි) තුමිය මෙසේ පවුලේ කටයුතු භාරගත් නිසා නබි (සල්) තුමා තම දූත මෙහෙවර කටයුතුවල නිදහසේ යෙදීමට හැකිවිය.

ආයිෂා (රලි) තුමිය සමඟ නබි (සල්) තුමා විවාහවීම “දිව්‍ය සම්බන්ධ” යක් බව පැවසේ. මහර් වශයෙන් දිර්හම් 500 ක් පිරිනැමූහ. මෙතුමියට “සිද්දිකා” සහ “අල්හුමෛරා” යනුවෙන් විශේෂ නම් ද ඇත. “උම්මුඅබ්දුල්” යනු අන්වර්ත නාමයයි. ආයිෂා (රලි) තුමිය තුළ බුද්ධිය, මතක ශක්තිය, එඩිතරකම, විරෝධාරභාවය, ඉවසීම වැනි ගුණාංග වලින් පිරී තිබිණි. හදීස් 2210 ක් පමණ මෙතුමිය විසින් පවසන ලදී.

අධ්‍යාපනය පිළිබඳ දක්ෂතාවයක් ද තිබිණි. සහබාවරුන්ගේ ඇතැම් සංකීර්ණ ආගමික ප්‍රශ්න මෙතුමිය තම තියුණු දැනුමින් විසඳුවාය. වෛදකම, නීතිය, අල්කුර්ආනය යනාදිය පිළිබඳව පුළුල් දැනුමක් ඇති මෙතුමිය විසින් ආගමික තීන්දු ද ලබා දී ඇත.

විවාහ වන විට මෙතුමියගේ වයස අවුරුදු නමයකි. මෙතුමිය සිය 18 වන වියේ දී වැන්දඹුවක් බවට පත් වුවාය. වහලුන් 57 දෙනෙක් පමණ මිළට ගෙන නිදහස් කර ඇත. නබි (සල්) තුමාගේ භාර්යාවන් අතර උපතින්ම මුස්ලිම් වූයේ මෙතුමියයි. නබි (සල්) තුමා සමඟ විවාහ වූ එකම කන්‍යාවද මෙතුමියයි. උහද් යුද්ධයේ දී තුවාල වූ අයට ජලය රැගෙනවිත් පොවමින් උදව් කළාය.

හසරත් උමර් (රලි) තුමා සිය කැමැත්තෙන්ම නබි (සල්) තුමාණන්ට හෆ්සා (රලි) තුමියව විවාහ කර දුන්හ. මෙතුමිය ආයිෂා (රලි) තුමියට පසුව දැනුමින් හා උගත්කමින් ශ්‍රේෂ්ඨ කාන්තාවකි. මෙතුමිය හදීස් 60 ක් දන්වා ඇත. නැමදීමෙන් හා අන් අයට ඉගැන්වීමෙන් කල් ගෙව්වාය. තම පියාවන උමර් (රලි) තුමා මෙන් දිරිමත් කාන්තාවකි. අබුබක්ර් (රලි)  තුමා විසින් අල්කුර්ආනයේ පිටපත තැන්පත් කර තිබුණේ මෙතුමිය සතුවයි.

උම්මුල් මසාකින් (දිළින්දන්ගේ මව) යන විශේෂ නාමයක් ලබා සිටි සෛනබ් බින්ති හුසෛමා (රලි) තුමිය දිළින්දන් කෙරෙහි කාරුණික වුවාය. මෙතුමියගේ ස්වාමි පුරුෂයා උහද් යුද්ධයේ දී ස්වර්ගස්ත වීමෙන් අනතුරුව නබි (සල්) තුමා අසරණ වූ සෛනබ් (රලි) තුමිය විවාහ කර ගත්හ. නජ්ජාසි රජතුමාගේ ඉල්ලීම පරිදි එසේ විවාහ කර ගත්හ.

උම්මු සල්මා (රලි) මැණියන්ද වැන්දඹුවකි. නබි (සල්) තුමා හිජ්රි 4 දී මෙතුමිය විවාහ කර ගත්හ. මෙතුමියගේ නම "හින්ද්" යන්නයි. "උම්මු සල්මා" යනු අන්වර්ත නාමයයි. "හබෂා" සහ "මදීනා" හිජ්රත්වල දී මෙතුමිය තම ස්වාමිපුරුෂයා සමඟ සහභාගි වුවාය. හදීස් 378 ක් මෙතුමිය පවසා ඇත. අගල් සහ කෛබර් යුද්ධවලට ද මෙතුමිය සහභාගි වී සිටියාය. හුදෛබියා ගිවිසුම් සමයේ දී සහබාවරුන්ගේ මානසික තත්ත්වය වටහාගෙන ඔවුන්ට උපදෙස් ලබා දී තත්ත්වය සමථයකට පත් කළාය. ගිවිසුම් අවසානයේ දී අල්ලාහ් වෙනුවෙන් කුර්බාන් පිරිනමන ලෙස නබි (සල්) තුමාට උපදෙස් දුන්නේ ද මෙතුමියයි. මදීනාවට හිජ්රත් ගිය කාන්තාවන් අතර මුලිකයෙක් වුවාය. මෙතුමිය තුළ විනය හා ඥානය පිරී තිබිණි. නබි (සල්) තුමා ගේ භාර්යාවන් අතරින් අවසාන වශයෙන් තම 84 වෙනි වියේ දී හිජ්රි 63 දී මිය ගියේ ද මෙතුමියයි.

හිජ්රි 5 වර්ෂයේදී නබි (සල්) තුමා සෛනබ් බින්ති ජහ්ෂ් (රලි) තුමිය විවාහ කර ගත්හ. ඉස්ලාමයේ උස් පහත් භේදයක් නැති බව කීම හුදෙක්ම කථාවට පමණක් සීමා වෙච්ච දෙයක් නොවන බව හැඟවීමට මෙතුමිය සමඟ වූ විවාහය සාධකයකි. කාන්තාවන් ෆර්දාව තුළ සිටිය යුතු බව හඟවන අණද මෙම අවස්ථාවේදී පනවන ලදී. මෙම විවාහය සිදුවිය යුතු බව අල්ලාහ් අල්කුර්ආනයේ ද පවසා ඇත.

මෙතුමිය අනෙක් අයට වඩා භක්තියෙන් අවංකකමින් පරිත්‍යාග කිරීමෙන්, උසස් වූ කෙනෙක් වන අතර අල්ලාහ්ගේ කරුණාව අපේක්ෂාවෙන් ඕනෑම දෙයක් කිරීමටද සූදානම්ව සිටියාය. එම නිසා "මෙතුමියට වඩා උසස් කාන්තාවන් තමන් නුදුටු" බව ආයිෂා (රලි) තුමිය විටෙක පවසා ඇත. මෙතුමිය දැල් වියා විකුණා ජීවිකාව ගෙන ගියාය. මහා දානපතිනියක් වූ නිසා නබි (සල්) තුමන් විසින් මෙතුමිය "දිගු අතැත්තිය" යනුවෙන් හඳුන්වන ලදී. මෙතුමිය හිජ්රි 20 වෙනි වර්ෂයේ දී තම 53 වෙනි වියේදී මිය ගියාය.

ජුවෛරියා (රලි) තුමිය යුද්ධයකදී මුස්ලිම්වරුන් විසින් අල්ලා ගනු ලැබුවාය. නබි (සල්) තුමා මෙතුමිය විවාහ කර ගත්හ. මෙතුමියගේ නම බර්රාය. නබි (සල්) තුමා, එය ජුවෛරියා යනුවෙන් වෙනස් කළහ. මෙතුමිය තපස් රකින්නියක් මෙන් චාම් ජීවිතයක් ගත කළාය. මෙතුමිය හිජ්රි 50 වෙනි වර්ෂයේ දී (ඇතැමෙක් 56 යනුවෙන් ද කියති) තම 65 වෙනි වියේදී මිය ගියාය.

**උම්මු හබීබා** (රලි) තුමිය : ඉස්ලාමය වැළැඳ ගැනීම නිසා මෙතරම් දුෂ්කරතාවලට කාන්තාවක් මුහුණ පෑම පිළිබඳව දැනගත් නබි (සල්) තුමා දරාගත නොහැකිව කනස්සල්ලට පත් වී තමන්ම එම කාන්තාව විවාහ කර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කළහ. හිජ්රි 7 දී විවාහය සිදුවිය. මෙතුමිය අබුසුෆ්යාන්ගේ දියණිය වේ. මෙතුමිය නබි (සල්) තුමන් කෙරෙහි තද ඇල්මක් දැක්වූවාය. හදීස් 65 ක් පමණ පවසා ඇත. මෙතුමිය නිර්මල හදවතක් සහිත කාන්තාවකි. මෙතුමිය විවාහ කිරීමෙන් විරෝධය පාලනය කිරීමටද හැකි විය. සෙසු සුන්නත් සලාතයන්ට වඩා අතිරේකව දිනපතා රකඅත් 12 ක් නෆිල් සලාත් ඉටුකරමින් සිටියාය. හසරත් උස්මාන් (රලි) තුමාගේ නිවස වට කරන ලද අවස්ථාවේ දී සම්බැගයක දිය රැගෙන ගොස් එම නිවැසියන්ට දීමට උත්සහ කළාය. මෙතුමිය හිජ්රි 44 දී මිය ගියාය.

**සෆියියා** (රලි) : සෙයනබ් යනු මෙතුමියගේ නමයි. මෙතුමිය කෛබර් යුද්ධයේ දී සිර අඩස්සියට ගන්නා ලදී. යුද්ධයේ දී ලැබෙන වස්තූන් අතර රජ්ජුරුවන්ට හෝ සෙන්පතිවරයාට හෝ ලැබෙන භාණ්ඩයට "සෆියයා" යනුවෙන් කීම අරාබිවරුන්ගේ සිරිතයි. එම නිසා මෙතුමිය එදා පටන් සෆියයා නමින් අමතන ලදී. හිජ්රි 7 දී මෙතුමිය නිදහස් කළ නබි (සල්) තුමා විවාහ කර ගත්හ. හිජ්රි 10 දී නබි (සල්) තුමාගේ අවසාන හජ් අවස්ථාවේ දී සෆියියා (රලි) තුමියද එහි සිටියාය. හිජ්රි 35 වෙනි වර්ෂයේ දී උස්මාන් (රලි) තුමාගේ නිවස වටකරන ලද අවස්ථාවේ දී මෙතුමිය බෙහෙවින් උදව් කළාය. මෙතුමිය විසින් බොහෝ නබි වදන් පවසා ඇත. අනෙකුත් භාර්යාවන් මෙන් නැණවත් කාන්තාවකි. මෙතුමියගේ තැන්පත් ගතිය හා ත්‍යාගශීලි බව කාගේත් පැසසුමට ලක්විය. මෙතුමිය රසූල් (සල්) තුමන් කෙරෙහි වැඩි ඇල්මක් දැක්වූවාය. මෙතුමිය සතුව දයාව හා මෘදු සිතක් තිබිණි. නබි (සල්) තුමන් වෙනුවෙන් පක්ෂව කථා කළාය. මෙතුමිය හිජ්රි 50 වෙනි වර්ෂයේදී තම 60 වෙනි වියේ දී මිය ගියාය.

**මෛමූනා** (රලි) තුමිය රසූල්වරයා විසින් විවාහ කරගත යුතු යැයි ජනතාව ප්‍රිය කළහ. එම නිසා හිජ්රි 7 දී 51 වෙනි වියැති මෛමූනා (රලි) තුමිය විවාහ කරගත්හ. රසූලුල්ලාහ්ගේ අවසාන විවාහය මෙයයි. මෙතුමිය කුරෙෂි ගෝත්‍රයේ හාරිද් බින් හසන් නම් ප්‍රසිද්ධ නායකයෙකුගේ දියණිය වූවාය. මෙමගින් මක්කාවේ ප්‍රබලයින් බොහෝ දෙනෙක් ඉස්ලාමය දෙසට හැරුණාහ. කාලිද් බින් වලිද් (රලි) ඉන් කෙනෙකි.

මෛමූනා (රලි) තුමිය හදීස් 46 ක් දන්වා ඇත. බොහෝ අවස්ථාවන්හි ආගමික තීන්දු ද ලබා දී ඇත. නබි (සල්) තුමාගේ අණට කීකරු වී ඒවා ඉටුකිරීමට වැඩි අවධානයක් යොමු කළාය. වහලුන් මිළට ගෙන නිදහස් කිරීමට කැමැත්තක් දැක්වූවාය. කාන්තාවන් ප්‍රතිසංස්කරණය කිරීමට ද ඔවුන්ට දේශනා කිරීමටද වැඩි ප්‍රියමනාපයක් දැක්වූවාය. මෙතුමිය හිජ්රි 51 වෙනි වර්ෂයේ දී මිය ගියාය.

නබි (සල්) තුමා ස්ත්‍රීන් ප්‍රිය ලෝලියෙක් වූයේ නම් කොපමණ තරුණ සුරූපීන් වුවද විවාහ කරගත හැකිව තිබිණි. නමුත් ඉස්ලාමය ස්ථිර කර ප්‍රචාරය කිරීම ස්ථිර කර ප්‍රචාරය කිරීම සඳහාම මෙතුමන් මෙසේ බොහෝ විවාහ සිදුකරගත්හ. එම මැණියන් නබි (සල්) සමඟ උරෙනුර ගැටී ඉස්ලාමයේ යහපත පිණිස වැඩ කළහ. නබි (සල්) තුමාගේ විවාහ ජිවිතයට දායක වෙමින් ද තම ධනය වියදම් කරමින් ද, යුද්ධවලදී වෙහෙස වෙමින් ද හදීස් කටපාඩම් කරමින් ද, ආගමික විසඳුම් ලබා දෙමින් ද ඔවුන් ඉස්ලාමයට අගනා සේවයක් කළහ.

කෙටියෙන් පිළිතුරු සපයන්න.

1. උම්මහාතුල් මුඃමිනීන් යන්නෙහි තේරුම කුමක්ද?
2. උම්මහාතුල් මුඃමිනීන් කී දෙනෙක් ද? ඔවුන්ගේ නම් සඳහන් කරන්න.
3. නබි (සල්) තුමන් බොහෝ ස්ත්‍රීන් විවාහ කිරීමට හේතු කවරේ ද?
4. දැල්විය ජිවිකාව ගෙන ගියේ, නබි (සල්) තුමාගේ කිනම් භායඝාවද?
5. "දිළින්දන්ගේ මෑණියෝ", "දිගු අතැත්තිය" නම් විශේෂ නම් වලින් අමතන ලද මැණියන්ගේ නම් සඳහන් කරන්න.
6. "උම්මහාතුල් මුඃමිනීන්" නම් නබි (සල්) තුමාගේ බිරින්දෑවරියන් ඉපදුණු හිජ්ර් වර්ෂ, ඔවුන් ගොනු කළ හදීස්, විශේෂ නම්, අන්වර්ත නම්, මියගිය වර්ෂය යනාදිය වගුගත කරන්න.
7. නබි (සල්) තුමාගේ භාර්යාවන් ඉස්ලාමයට ලබාදුන් දයකත්වය කෙටියෙන් ලියන්න.
8. දිනපතා රකඅත් 12 ක නෆිල් සලාතය ඉටුකරමින් සිටි මැණියගේ නම කුමක් ද?

# 7.4 අහ්ලුල් බෙත්

නබි (සල්) තුමාණන්ගේ ජිවිත කාලය, මක්කා ජිවිත කාලය හා මදීනා ජිවිත කාලය යනු පරිච්ඡේද දෙකකට බෙදා වෙන් කර පෙර පාඩම්වල ඉගෙන ගත්තා සේම නබිතුමාණන්ගේ භාර්යාවන් ගැනද දැන ගත්තෙමු.

මෙම පාඩමෙහි නබි (සල්) තුමාණන්ගේ පවුලේ සමාජිකයන් ගැන දැන ගනිමු. "අහ්ලුල් බෙත්" යන විශේෂිත නාමයෙන් ඔවුන් හඳුන්වනු ලබති. විශේෂයෙන් නබි (සල්) තුමාණන්ගේ ආදරණීය දියනියන් වු ෆාතිමා (රලි) තුමිය හා එතුමියගේ සැමියාණන් වු අලි (රලි) ගෙන් පැවත එන්නන් මේ නාමයෙන් හඳුන්වනු ලබති. අප මෙම පාඩමෙහි අහ්ලුල් බෙත් හි විශේෂිත සමාජිකයන් වු හසන් (රලි), හා හුසෙන් (රලි) තුමන්ලා ගැන අවධානය යොමු කරමු.

## හසන් (රලි) තුමා

අලි (රලි) තුමා හා ෆාතිමා (රලි) තුමිය යන යුවලගේ වැඩිමහල් පුත්‍රයා ලෙස හිජ්රි 3 වෙනි අවුරුද්දේ උපත ලැබුවේය. එතුමන් කුඩා කල සිටම නබිතුමන්ගේ ඇසුර ලැබීමට භාග්‍ය ලබා යහපත්ව වැඩුණේය. වසර අටක පමණ කාලයක් එතුමාණන්ගේ ආදරයට පාත්‍රවෙමින් සෙනෙහසින් වැඩුනේය. තමාගේ වයසට ගැලපෙන පරිදි තියුණු බුද්ධිය, යහපත් ගතිගුණ වැනි දෑ නබිතුමාණන්ගේ මග පෙන්වීමෙන් ලබා ගත්හ.

ඉස්ලාමිය රාජ්‍යයේ සිව්වන කලිෆා හා හසන් (රලි) තුමන්ගේ ආදරණිය පියාණන් වන අලි (රලි) තුමාගේ අභාවයෙන් පසුව ඉස්ලාමිය රාජ්‍යයේ කලිෆා ලෙස හසන් (රලි) තුමාව තෝරා පත් කරනු ලැබුහ. මාස හයක පමණ කාලයක් එම තනතුර හෙබවුවේය.

එවිටත් හිටපු කලිෆා වන අලි (රල්) තුමා හා මුආවියා (රලි) තුමන් අතර ඇතිව තිබු ආරවුල තවදුරටත් වර්ධනය වීම අනුමත නොකෙරූ හසන් (රලි) තුමා, මුආවියා (රලි) තුමා හට රාජ්‍ය භාරදී ඉන් ඉවත් වුවේය. නමුදු දුෂ්ඨයන්ගේ අමනෝඥ ක්‍රියා හේතුවෙන් හිජ්රි පනස්වෙනි වසරේ වස ශරීරගත වීමෙන් මරණයට ගොදුරු වුහ.

හසන් (රලි) තුමා නබි (සල්) තුමාණන්ගේ අඩිපාරේ යමින් බුද්ධියෙන් හා ඥානයෙන් තම පියාණන් සේම වැජඹුනේය. ජනයාගේ ගැටළුවලට නිසි පිළිතුරු දී ඔවුන් සැනසුහ. මුආවියා (රලි) තුමාද සමහර අවස්ථාවල හසන් (රලි) තුමාගෙන් යම් ගැටළුවලට පිළිතුරු ලබා ගෙන ඇත්තේය.

දිළින්දන්ට උදව් උපකාර කිරීමෙහි ලා ඉහල ස්ථානයක සිටි මෙතුමා වරෙක දිර්හම් දහදාහක අවශ්‍යතාවයක් තිබු මිනිසකු සොයා ගොස් එම මුදල පරිත්‍යාග කොට ඇති බව ඉස්ලාමිය ඉතිහාසඥවරු පෙන්වා දෙති.

ඉවසිලිවන්ත භාවය, විඳදරා ගැනිමේ ශක්තිය හා තවත් බොහෝ ගතිගුණ වලින් පිරිපුන් වු මෙතුමා පරිපුර්ණ මිනිසෙකු විය. වරෙක රසුල් (සල්) තුමාණන් "හසන් (රලි) තුමා හට මාගේ ඉවසිලිවන්තකම හා ප්‍රතිරූපය ලැබී ඇතැයි" ප්‍රකාශ කර සිටියහ.

## 7.4.2 හුසෛන් (රලි) තුමන්

අලි (රලි) තුමාගේ හා ෆාතිමා (රලි) තුමියගේ ආදරණීය පුතනුවන් වශයෙන් හිජ්රි හතරවන අවුරුද්දේ මෙතුමා උපත ලැබුවේය. මෙතුමන්ගේද ළමා කාලය නබි (සල්) තුමාණන් සමඟ ගෙවීමට භාග්‍ය ලද්දේය.

විවේකය ලැබෙන සෑම අවස්ථාවකම නබි (සල්) තුමාණන් තම මුනුබුරන් වන හසන් හා හුසෛන් (රලි) තුමාණන් සමඟ ගත කිරීමට පුරුදු වී සිටියහ. මුණුබුරන් දෙපල තම උරහිසෙහි දරා මස්ජිදයට කැඳවා ගියහ. නබිතුමාණන් සලාතයේ යෙදී සිටින අවස්ථාවල හසන් (රලි) හා හුසෛන් (රලි) දෙපල එතුමන්ගේ උරහිසෙහි නැග සිටීමට පුරුදු වී සිටියහ. එම අවස්ථාවල නබි (සල්) තුමාණන්ගේ සුජුද් කිරීම මුණුබුරන් දෙදෙනා බිමට බසිනා තෙක් දීර්ඝ විය.

මුආවියා (රලි) තුමාගෙන් පසු ඔහුගේ පුත් "යසීද්" නැමැත්තා රාජ්‍ය නායක තනතුරට පත්විය. යසීද් නැමැත්තා රාජ්‍ය පාලනය කිරීමේ හැකියාවන්ගෙන් හා ලක්ෂණයන්ගෙන් නොපිරිපුන් තැනැත්තෙකු විය. මෙම තත්ත්වය හුසෛන් (රලි) තුමාගේ කණස්සල්ලට හේතු විය. ඉරාකයේ කුෆා නගර වැසියන් කලීෆා යසීද්ට එරෙහිව අරගල කරන්නට පටන් ගත්හ. තම අරගලයට නායකත්වය දෙන ලෙස කුෆා නගර වැසියන් හුසෛන් (රලි) තුමාගෙන් ඉල්ලා සිටි හෙයින් මෙතුමා තම පවුලේ සමාජිකයන්ද කැටුව කුෆාව බලා ගමන් ඇරඹූහ. ඉරාකයට යන අතරමගදී කුෆාවට ආසන්න "කර්බලා" නම් ස්ථානයේදී යසීද්ගේ හමුදාව මගින් මග අහුරණු ලැබ එහි හටගත් සටනේදී හිජ්රි හැට එක්වන වසරේදී මරණයට පත්වූහ.

ආයුක්තියට හා අසාධාරණය හමුවේ නොසැලෙන, එඩිතර වු පුද්ගලයෙකු ලෙස ප්‍රසිද්ධියක් උසුලන මෙතුමා තම පියාණන් වන අලි (රලි) තුමාණන් වගේම තියුණු නුවණින් යුක්ත වූහ. ඉස්ලාමීය නීති රීති ගැන මනා අවබෝධයකින් පිවත් වු මෙතුමා තම සහෝදරයාණන් වු හසන් (රලි) තුමා සේම පරිත්‍යාගශීලි චන්තයෙක්ද වූහ.

ආදරය, කරුණාව, සැහැල්ලු බව යන උසස් ගුණාංගවලින් පිරිපුන්ව පිවත් වුයේය. මෙතුමන්ලාගේ ජීවිතයෙන් බොහෝ මග පෙන්වීම් අපට ලබා ගත හැකිව ඇත.

<u>අභ්‍යාස</u>

කෙටි පිළිතුරු සපයන්න.

1. "අහ්ලුල් බෛත්" යන්නෙන් කුමක් පැහැදිලි කරන්නේදැයි විස්තර කරන්න.
2. හසන් (රලි) තුමන් උපන් වසර සඳහන් කරන්න.
3. හසන් (රලි) තුමන් කලීෆා තනතුර හෙබවූ කාලය සඳහන් කරන්න.
4. හසන් (රලි) තුමන් කව්රුන් වෙත රාජ්‍ය බාරකෙරුවේ ද?
5. හුසෛන් (රලි) තුමන් කිනම් ස්ථානයේ පැවති සටනේදී ජීවිතක්ෂයට පත්වූවේ ද?